# ලංසු කැඳවීම (අයි.එෆ්.බී)

## ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාපටිපාටිය (එන්.සී.බී)

**ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් (එස්.එල්.අයි.බී.ටී.ඊ.සී) සඳහා උපකරණ, උපාංග සහ රසායනාගාර අවශ්‍යතා ප්‍රසම්පාදනය කිරීම, අදියර I ගොඩනැගිල්ල, මාහේන්වත්ත, තලගල පාර, පිටිපන, හෝමාගම**

**කොන්ත්‍රාත් ගිවිසුම් අංකය: එස්.එල්.අයි.බී.ටී.ඊ.සී/ පී.ආර්.ඕ.සී/002/එන්.සී.බී/ජී & එස්/ උපකරණ, උපාංග සහ රසායනාගාර අවශ්‍යතා**

1. **ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් (එස්.එල්.අයි.බී.ටී.ඊ.සී) හි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් හෝමාගම, පිටිපන, තලගල පාර, මාහේන්වත්ත, අදියර I ගොඩනැගිල්ල හි පිහිටි එස්.එල්.අයි.බී.ටී.ඊ.සී ආයතනය සඳහා උපකරණ, උපාංග සහ රසායනාගාර අවශ්‍යතා ප්‍රසම්පාදනය සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.**

2. කොන්ත්‍රාත්තු ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, අදාළ ලංසුකරු අසාදු ලේඛනගත නොවිය යුතු අතර, සුදුසුකම් නිර්ණායකයන්ට අනුව අදාළ ක්ෂේත්‍රයේ ව්‍යාපාර ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

3. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට වැඩිදුර තොරතුරු හෝමාගම, පිටිපන, තලගල පාර, මාහේන්වත්ත, අදියර I ගොඩනැගිල්ල හි පිහිටි ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් හි දුරකථන අංක: 0113 431 844 සහ ඉලෙක්ට්‍රොනික තැපැල්: slibtec@gmail.com, Info@slibtec.gov.lk වෙතින් ලබා ගත හැකි අතර, ලංසු ලේඛන පරීක්ෂා කිරීම වැඩ කරන දිනයන්හි පැය 09:30 සිට පැය 15:30 දක්වා කාලය තුළදී එස්.එල්.අයි.බී.ටී.ඊ.සී හි ප්‍රසම්පාදන අංශයේදී හෝ එස්.එල්.අයි.බී.ටී.ඊ.සී වෙබ් අඩවියෙන් ලබා ගත හැක. (https://www.slibtec.gov.lk/procurement)

4. මෙම ලංසු කැඳවීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, සම්පූර්ණ ලංසු ලේඛනයේ ඉංග්‍රීසි පිටපතක් 2022 අප්‍රේල් මස 26 වන දින සිට 2022 මැයි මස 18 වන දින දක්වා කාලය තුළදී එස්.එල්.අයි.බී.ටී.ඊ.සී වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය. (https://www.slibtec.gov.lk/procurement)

5. ආපසු නොගෙවන රුපියල් 4,000/- ක ගාස්තුව මහජන බැංකුවේ හෝමාගම ශාඛාවේ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් හි ගිණුම් අංක 049-1-001-7-0067474 වෙත තැන්පත් කළ යුතුය. <u>(සටහන: කරුණාකර මුදල් තැන්පතු පත්‍රිකාවේ තැන්පත්කරුගේ විස්තර සහ තැන්පතුවල අරමුණ “ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු” ලෙස සඳහන් කර එම මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත ලංසුව සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. මෙම ගෙවීම මුදලින් සිදු කළ යුතු අතර අනෙකුත් ගෙවීම් ක්‍රම සඳහා අවසර නොමැත).</u>

6. ලංසු, අනුපිටපතක් සහිතව (පිටපතක් සමඟ) ලංසු අංකය පැහැදිලිව හඳුනාගත හැකි ලෙස සඳහන් කළ මුද්‍රා තැබූ ලියුම් කවරයන්හි සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් (එස්.එල්.අයි.බී.ටී.ඊ.සී), අදියර I ගොඩනැගිල්ල, මාහේන්වත්ත, තලගල පාර, පිටිපන, හෝමාගම යන ලිපිනයට 2022 මැයි මස 18 වන දින, පැය 10:00. පෙර ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු ලබා ගැනිමේ කාලය අවසන් වූ සැනින්, ලංසු විවෘත කිරීම සඳහා සහභාගී වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදි ලංසු විවෘත කරනු ලැබේ.

7. ලංසු, ඒවා විවෘත කළ දින සිට දින 60 ක් සඳහා වලංගු වන අතර, සියලුම ලංසු සමඟ රුපියල් 200,000/- ක ලංසු ඇප තැන්පතුවක් ද ඉදිරිපත් කළ යුතු වේ. ලංසු ඇපය, ලංසුවේ වලංගු දිනයෙන් ඔබ්බට දින 28 ක් දක්වා වලංගු විය යුතුය.

8. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් හි සහ තාක්‍ෂණ අමාත්‍යාංශයේ පාලනය යටතේ ඇති වෙනත් ආයතනයක සේවයේ නියුතු සේවකයෙකු සමඟ ඥාති සබඳතාවක් ඇති සේවානියුක්තියෙකු හෝ සමාගමක් සහ/හෝ පුද්ගලයෙකු මෙම ලංසු ප්‍රදානය සඳහා නුසුදුස්සන් වේ.

**සභාපති**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**
**ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් (එස්.එල්.අයි.බී.ටී.ඊ.සී)**
**2022 අප්‍රේල් 25**